# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.02.20 පැය 1110 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 362/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**අවශ්‍ය කරන සැකකාරියක් අත්අඩංගුවට ගැනීම සඳහා**
**මහජන සහාය පැතීම.**

2025.02.19 වන දින කෙසෙල්වත්ත පොලිස් වසමේ අළුත් කඩේ අංක 05 ගරු මහේස්ත්‍රාත් අධිකරණය තුළ දී සංවිධානාත්මක අපරාධකරුවකු වන සංජීව කුමාර සමරරත්න නොහොත් ගනේමුල්ල සංජීව යන අය වෙඩි තබා ඝාතනය කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාසය විසින් විමර්ශන ආරම්භ කර ඇත. මෙම වෙඩි තැබීම සිදු කරන ලද වෙඩික්කරුට ආධාර අනුබල ලබා දුන් සැකකාර කාන්තාවක් හඳුනා ගැනීම සඳහා පොලිසිය මහජන සහාය පතයි.

**සැකකාරියගේ විස්තර :-**

| | | | |
|---|---|---|---|
| **01.** | නම | :- | පිංපුර දේවගේ ඉෂාරා සෙව්වන්දි |
| **02.** | වයස | :- | අවුරුදු 25 |
| **03.** | ජා.හැ.අ | :- | **995892480v** |
| **03.** | ලිපිනය | :- | **243/01, මීගමුව පාර, ජය මාවත, කටුවැල්ලේගම.** |

සැකකාරිය අත්අඩංගුවට ගැනීම සඳහා ඡායාරූප මේ සමඟ ඔබ මාධ්‍ය වෙත යොමු කරන අතර, සැකකාරිය සම්බන්ධයෙන් යම් තොරතුරක් වෙතොත් පහත සඳහන් දුරකථන අංක වෙත දැනුම් දෙන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

**දුරකථන අංක :-**

- ❖ **අධ්‍යක්ෂ, කොළඹ අපරාධ කොට්ඨාසය - 071 - 8591727**
- ❖ **ස්ථානාධිපති, කොළඹ අපරාධ කොට්ඨාසය - 071 - 8591735**

මෙම සැකකාරිය පිළිබඳව සාර්ථක තොරතුරක් ලබා දෙන අයෙකුට පොලිස් ත්‍යාග අරමුදලින් මුදල් ත්‍යාගයක් පිරිනැමීමට වැඩබලන පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතා තීරණය කර ඇත. එමෙන්ම තොරතුරු ලබා දෙන අයගේ රහස්‍යභාවය ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා පොලිසිය කටයුතු කරනු ඇත.

ඉහත නිවේදනය මහජනතාවගේ දැනගැනීම සඳහා ඔබ මාධ්‍ය ආයතනය මඟින් ප්‍රචාරයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**